සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

නම : ............................................ **පුරවැසි අධ්‍යාපනය** කාලය : පැය 02 යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(අවබෝධයෙන්/ විලාසිතා/ නිර්මිත/ චිරිත්/ සම්මතයන්)

(1) ස්වාභාවික පරිසරය තුළ මිනිසා විසින් සකසන දෑ ................................................................................ පරිසරයට අයත් වේ.

(2) අප විසින් අනුගමනය නොකළ යුතු දේ, ..................................................... නම් වේ.

(3) සංස්කෘතියට නොගැළපෙන .............................................................. භාවිත කිරීම සමාජයේ ක්‍රියාත්මක වන නිසරු ප්‍රතිඵල අත්වන දෙයකි.

(4) අවධානයෙන් හා .............................................................. යුතුව අසා සිටීම සක්‍රීය සවන් දීම වේ.

(5) අතීතයේ සිට පැවත එන සමාජ ..................................................................... සම්ප්‍රදායන් වේ.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරැදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) විවිධ අවස්ථාවන් සම්බන්ධව පවතින සම්ප්‍රදායන් හා පනවා ඇති නීති රීති මගින් සමාජ යහපත හා පුද්ගල යහපත උදා වේ. ( )

(7) ජනගහනය වැඩි වීමත්, මිනිස් අවශ්‍යතා වැඩිවීමත් නිසා සම්පත් ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණය දිනෙන් දින පහළ බසී. ( )

(8) ගල් අඟුරු, ටින්, තඹ ආදී ඛණිජ සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී ඒවා ක්ෂය වන අතර එම සම්පත් ඉතාම කෙටි කාලයක් තුළ දී නැවත වර්ධනය වේ. ( )

(9) දේශීය නිෂ්පාදන හා දේශීය සම්පත් අගය කිරීම තුළින් නිෂ්පාදකයාටත්, පාරිභෝගිකයාටත් දේශීය භාණ්ඩ පිළිබඳ අභිමානයක් ඇති වේ. ( )

(10) අතීත ලාංකිකයා සතුව පැවති වාරි තාක්ෂණ ඥානය නූතන තාක්ෂණය මෙන්ම ප්‍රබල වේ. ( )

- **අංක 11 15 දක්වා ප්‍රශ්නවල නිවැරැදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) නිදහස් අධ්‍යාපනයේ පියා යනුවෙන් හඳුන්වනු ලැබුයේ,
1. ටී. බී. ජයා මහතා ය.
2. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ය.
3. සේනක බිබිලේ මහතා ය.
4. එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ය.

(12) පුද්ගලයකු සතු යහපත් ගති ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ආත්මාර්ථකාමී බව, සැක කිරීම, විනයගරුක බව
2. ආවේගශීලී බව, බොරු කීම, සරල වීම.
3. ප්‍රියවචන කතා කිරීම, කාරුණික වීම, සත්‍යවාදී වීම.
4. කෝපවීම, ඉවසීම, ඊර්ෂ්‍යා කිරීම.

(13) සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන යහපත් ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. ආත්ම විශ්වාසය අවම වීම.
2. ගැටලු වැඩිවීම.
3. සිතේ පීඩාකාරී බව ඇතිවීම.
4. කරන කාර්යය පහසු වීම.

(14) සැලසුම්සහගත නොවූ ශිෂ්‍යයා තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. තම අරමුණු ඉටුකර ගැනීම.
2. පහසුවෙන් අභියෝග ජය ගැනීම.
3. වැඩ කල් දැමීම.
4. අත්‍යවශ්‍ය පියවර අත් නොහැරීම.

(15) පොදු දේපළවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. පොදුවේ සැමට පරිහරණය කළ හැකි වීම.
2. ලාභ අපේක්ෂාවෙන් රජය සැපයීම.
3. ආදායම් උපයන අයට පමණක් සැපයීම.
4. අනාගත පරපුර පිළිබඳ සැලකිලිමත් නොවීම.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු ලියන්න.**



A.

(16) A පින්තූරයෙන් දැක්වෙන සිදුවීම නිවැරැදිව හඳුනාගෙන එවැනි සිදුවීමක් ඇතිවීමට බලපාන හේතු 02ක් ලියන්න.
1. ..........
2. ..........

(17) A පින්තූරයෙන් දැක්වෙන සිදුවීම තුළින් ඇතිවන ප්‍රතිඵල 02ක් ලියන්න.
1. ..........
2. ..........



B.

(18) පාසල තුළ දරුවකු සාමූහිකව කටයුතු කරන අවස්ථාවක් ඉහත B පින්තූරයෙන් දැක්වේ. එවැනි අවස්ථාවක දී ඔබට ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න.
1. ..........
2. ..........

(19) අන් අය දක්ෂතා පෙන්වන විට එම දක්ෂතා අගය කිරීමට ඔබ භාවිත කරන ක්‍රම 02ක් ලියන්න.
1. ..........
2. ..........

(20) අන් අයගෙන් ඔබ ප්‍රශංසා ලබන විට ඔබට දැනුණ හැඟීම් 02ක් ලියන්න.
1. ..........
2. ..........

(ලකුණු 2 × 20 = 40)

# II කොටස

වැදගත් ：

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

01. (i) ස්වාභාවික සම්පතක් වන භූමිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 02ක් ලියන්න.

භූමිය
1. ..........................................................................................
2. ..........................................................................................


(ලකුණු 02)

(ii) මානව සම්පත විධිමත්ව පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

(ලකුණු 02)


(iii)



A



B




C



D



E



F

ඉහත A, B, C, D, E, F අක්ෂරවලින් දැක්වෙන භෞතික සම්පත් පහත කාණ්ඩ දෙක යටතේ ප්‍රභේද කර දක්වන්න. (ඉංග්‍රීසි අක්ෂරවලින් ලියන්න.)

භෞතික සම්පත්
- ස්වාභාවික ..............................................................
- ස්වාභාවික නොවන ..............................................................

(ලකුණු 06)

(iv) භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග 03ක් ලියන්න.

1. ........................................................................................................................
2. ........................................................................................................................
3. ........................................................................................................................ (ලකුණු 03)

(v) ඔබ ජීවත් වන ප්‍රදේශයේ දක්නට ලැබෙන ස්වේච්ඡා සංවිධාන 03ක් නම් කරන්න..

1. .......................................................... 2. ..........................................................
3. .......................................................... (ලකුණු 03)

02. (i) පාසල විවිධ පුද්ගල කණ්ඩායම් හා ප්‍රජාව සමග සම්බන්ධතා පවත්වයි. පහත දැක්වෙන්නේ පාසලක් හා අවට ප්‍රජාව අතර සම්බන්ධතා පවත්වන ආකාරය දැක්වෙන සටහනකි. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

පාසල
- A. ..........................................................
- B. ..........................................................
- C. ආදිශිෂ්‍යයන්
- D. ජනතා නියෝජිතයන්
- E. ..........................................................
- F. ..........................................................

(ලකුණු 04)

(ii) පාසල විවිධ අවස්ථාවල දී ප්‍රජා කටයුතු සඳහා සම්බන්ධ වේ. ප්‍රජා සේවා සඳහා පාසල යොදාගන්නා අවස්ථා 03ක් නම් කරන්න.

1. ........................................................................................................................
2. ........................................................................................................................
3. ........................................................................................................................ (ලකුණු 03)

(iii) පාසල් සාමාජිකයෙකු ලෙස ඔබෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.


| *ඔබ සතු අයිතිවාසිකම්* | *එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්* |
|---|---|
| පාසල තුළ ආරක්ෂා සහිතව සිටීම. | 1. ..................................................<br>2. .................................................. |
| අධ්‍යාපනය ලැබීම. | 1. ..................................................<br>2. .................................................. |

(ලකුණු 04)

03. (i) විවිධ රැකියාවල නියුතු මානව සම්පත් කිහිපයක් අංක 01 සිට 06 දක්වා පින්තූරවලින් පහත දක්වා ඇත. මෙම පින්තූර නිවැරැදිව හඳුනාගෙන පහත සටහන සම්පූර්ණ කරන්න.

- කායික හැකියා
  - ......................
  - ......................
  - ......................
- හැකියා
- මානසික හැකියා
  - ......................
  - ......................
  - ......................


(1)


(2)


(3)


(4)


(5)


(6)

(ලකුණු 03)

(ii) ඵලදායී භෞතික සම්පතක් ලෙස 'ජලය' මඟින් සැලසෙන පුද්ගල, සමාජ හා ආර්ථික අවශ්‍යතා ඇසුරින් පහත රූපය සම්පූර්ණ කරන්න.

ජලය

1. පුද්ගල අවශ්‍යතා
   1. නෑමට
   2. ....................................................................
2. සමාජ අවශ්‍යතා
   1. සෞඛ්‍ය කටයුතු සඳහා
   2. ....................................................................
3. ආර්ථික අවශ්‍යතා
   1. ගොවිතැන් කටයුතු සඳහා
   2. ....................................................................

(ලකුණු 03)

(iii) පහත දැක්වෙන්නේ එදිනෙදා ජීවිතයේ දී සහය වන පුද්ගලයන් හා ඔවුන්ගෙන් ඉටුවන කාර්යයන් කිහිපයකි. ඒවා නිවැරැදිව යා කරන්න.

| "අ" | "ආ" |
|---|---|
| ග්‍රාම නිලධාරි | 1. ප්‍රදේශය තුළ අපරාධ වැළැක්වීමට කටයුතු කිරීම. |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා | 2. රථවාහන අලුත්වැඩියා කිරීම. |
| පොලිස් නිලධාරි | 3. මුදල් ඇණවුම් යැවීම. |
| කාර්මික ශිල්පියා | 4. ගම්වැසියන්ගේ පදිංචිය තහවුරු කිරීම. |
| තැපැල් ස්ථානාධිපති | 5. බෝවන රෝග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම. |

(ලකුණු 05)

04. **මහනුවර/ නාවල/ කුරුණෑගල/ හලාවත/ වාරියපොල/ මාදම්පෙ/ යාපනය**

(i) ඉහත දැක්වෙන නගර අතරින් මහනගර සභා බල ප්‍රදේශ 03ක් තෝරා ලියන්න.

**මහ නගර සභා බල ප්‍රදේශ**

1. ......................................................
2. ......................................................
3. ...................................................... (ලකුණු 03)

(ii)
A. බල ප්‍රදේශය තුළ මංමාවත් ඉදිකිරීම හා නඩත්තු කිරීම.
B. උප්පැන්න සහතික නිකුත් කිරීම.
C. සහනාධාර ලබාදීම.
D. කුණුකසල නිසි ලෙස බැහැර කිරීම.
E. වෙළෙඳපොළවල් පවත්වාගෙන යාම.
F. හැඳුනුම්පත් නිකුත් කිරීම.
G. විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කටයුතු
H. නිවාස ඉදිකිරීම් අනුමත කිරීම.

ඉහත දැක්වෙන්නේ ආයතන දෙකක කාර්යයන් කිහිපයකි. ඒ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදුකෙරෙන කාර්යයන් | ප්‍රාදේශීය සභාව මගින් සිදු කෙරෙන කාර්යයන් |
|---|---|
| 1. ...................................................................... | 1. ...................................................................... |
| 2. ...................................................................... | 2. ...................................................................... |
| 3. ...................................................................... | 3. ...................................................................... |
| 4. ...................................................................... | 4. ...................................................................... |
| 5. ...................................................................... | 5. ...................................................................... |

(ලකුණු 08)

05. (i) ඔබ පුරවැසි අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයෙකු ලෙස පහත අවස්ථාවන්හි දී විනය හා ශික්ෂණයෙන් යුක්තව කටයුතු කරන ආකාර 02 බැගින් සඳහන් කරන්න.

**පවුල තුළ දී**

1. ..............................................................................
2. ..............................................................................

**සමාජයේ දී**

1. ..............................................................................
2. .............................................................................. (ලකුණු 04)

(ii) මනා විනයකින් හා ශික්ෂණයකින් යුක්තව ජීවත් වීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන (වාසි) 03ක් ලියා දක්වන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. .......................................................................................................................... (ලකුණු 03)

(iii) සමාජයේ ක්‍රියාත්මක වන සරු හා නිසරු දේ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ | එයින් ලැබෙන යහපත් ප්‍රතිඵල | සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දේ | එයින් ලැබෙන අයහපත් ප්‍රතිඵල |
|---|---|---|---|
| පොත් කියවීම | ............................................<br>............................................ | මත්ද්‍රව්‍ය භාවිතය | ............................................<br>............................................ |
| කළණ මිතුරු ඇසුර | ............................................<br>............................................ | නුසුදුසු ආහාරපාන භාවිතය | ............................................<br>............................................ |

(ලකුණු 04)

06. (i) යහපත් පුරවැසියකු ලෙස ඔබ විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග හා එම ගුණාංග නිසා ඔබට ලැබෙන ප්‍රතිඵල ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න.

A. ආචාරශීලීව භාෂාව හැසිරවීම.
- හිතමිතුරන් වැඩිවීම.
- ..........................................................................................................

B. ....................................................
- අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා සම්පත් ඉතිරි වීම.
- පරිසරයට සිදුවන හානි අවම වීම.

C. සම්ප්‍රදායන් හා නීතිරීතිවලට ගරු කිරීම.
- ..........................................................................................................
- සමාජය තුළ ගැටුම් අවම වීම.

D. ....................................................
- ජනතාවට අවශ්‍ය සේවා කාර්යක්ෂමව සැපයීමට හැකිවීම.
- නැවත අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා යන වියදම් ඉතිරි වීම.

(ලකුණු 04)



A.



B.



C.



D.

(ii) ඉහත A, B, C, D රූප සටහන් ඇසුරින් පෙන්නුම් කරනුයේ පරිසරය දූෂණය වීමට බලපාන ක්‍රියාකාරකම් කිහිපයකි. එම ක්‍රියාකාරකම් තුළින් දූෂණය වන පරිසර අංගය හඳුනාගෙන නම් කරන්න.

A. ............................................................ B. ............................................................

C. ............................................................ D. ............................................................

(ලකුණු 04)

(iii) ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස දේශීය නිෂ්පාදන හා දේශීය සම්පත් අගය කිරීමෙන් ඇති ප්‍රයෝජන 03ක් ලියා දක්වන්න.

1. ............................................................................................................

2. ............................................................................................................

3. ............................................................................................................ (ලකුණු 03)


07. හරහට හා පහළට දැක්වෙන උපකාරක පද උපයෝගී කරගෙන පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

*හරහට*

5. මේවා එකතු කිරීම සමාජය තුළ දක්නට ලැබෙන සරු විනෝදාංශයකි.
6. පාසල් ගීතය ගායනා කරන විට මෙසේ සිටිය යුතුය.
8. සමාජ සම්මතයන්ට අනුව කටයුතු කිරීම හා නීතිරීති අනුගමනය කිරීමෙන් මෙය ඇති වේ.
10. මේවා පසට එකතු වූ විට දිරාපත් නොවේ.
11. පාසලක දැනුම ගබඩා කර ඇති ස්ථානයක් වේ.

*පහළට*

1. මේවා කීමෙන් තම දුර්වලතා ප්‍රදර්ශනය වේ.
2. ලෝක උරුමයක් සේ සැලකෙන අතීත අභිමානය විදහාපාන ස්ථානයකි.
3. දේශීය නිෂ්පාදනයක් වන මේවා නිෂ්පාදනයට අම්බලන්ගොඩ ප්‍රසිද්ධ වේ.
4. පුද්ගලයකු සතු යහපත් ලක්‍ෂණයකි.
7. ඔබ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධානයකි.
9. දේශීය ආහාරයකි.




(ලකුණු 11)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

## I කොටස

01. නිර්මිත
02. චාරිත්‍ර
03. විලාසිතා
04. අවබෝධයෙන්
05. සම්මතයන්
06. (✓)
07. (✗)
08. (✗)
09. (✓)
10. (✓)
11. (2)
12. (3)
13. (4)
14. (3)
15. (1)

16.
- රියදුරාගේ නොසැලකිලිමත් බව
- ජංගම දුරකථන ක්‍රියාකරමින් රිය පැදවීම.
- බීමත්ව රිය පැදවීම.
- මාර්ග නීතිරීති සංඥා ආදියට අවනත නොවීම.

(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

17.
- ජීවිත විනාශ වීම.
- ආබාධිත තත්ත්වයන් ඇතිවීම. (ආබාධිතයන් වීම.)
- මියයෑම.
- දරුවන් අසරණ වීම. (මවුපියන් අහිමි වීම.)

(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

18.
- සාමූහිකව වැඩ කිරීම.
- අන්මතවලට ඇහුම්කන් දීම.
- නායකත්වයට ගරු කිරීම.

(ආදී පිළිතුරුවලට ලකුණු දෙන්න.)

19.
- අත්පොළසන් දීම.
- හොඳයි
- මරු

(ආදී පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.)

20.
- සතුටක් දැනීම.
- තව තවත් දිරිමත් වීම.
- බලාපොරොත්තු ඇතිවීම.

(අදාළ පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.)

## II කොටස

(01) (i)
- ගොවිතැන් කටයුතු
- ගොඩනැගිලි ඉදිකිරීම.
- මහාමාර්ග ඉදිකිරීම.

(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(ii)
- හැකියාවන් දියුණු වේ.
- වෘත්තීය ඉතා හොඳින් කළ හැකි වේ.
- ආර්ථික වශයෙන් වාසි සැලසේ.

(පිටුව 58)

(iii)

| | |
|---|---|
| ස්වාභාවික | B D F |
| ස්වාභාවික නොවන | A C E |

(iv)
- වනාන්තර සුරැකීම.
- රුක් රෝපණය
- සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම
- පාංශු සංරක්ෂණය

(පිටුව 56)

(v)
- මරණාධාර සමිති
- අවමංගල්‍යාධාර සමිති
- ක්‍රීඩා සමිති
- සුබසාධක සමිති

(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

02. (i) (A) සුබපතන්නන් (B) දෙමාපියන්
(E) විවිධ සංවිධාන (F) පූජනීය උතුමන්

(ii)
- අවුරුදු උත්සව පැවැත්වීම සඳහා
- වෛද්‍ය සායන
- සෞඛ්‍ය කටයුතු
- දහම් පාසල් තරග
- දහම් පාසල් ශ්‍රේණි විභාග
- විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන්
- සමථ මණ්ඩල කාර්යයන් සඳහා

(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(iii) ***පාසල තුළ ආරක්ෂා සහිතව සිටීම.***
- සෙසු අයගේ ආරක්ෂාව තහවුරු වන ලෙස හැසිරීම.
- අනාරක්ෂිත ක්‍රියාකාරකම්වලින් වැළැකීම.
- අනාරක්ෂිත ස්ථාන කරා ළඟා නොවීම.

● වැඩිහිටි සිසුන්ගේ හා කාර්ය මණ්ඩල උපදෙස් පිළිපැදීම.

*අධ්‍යාපනය ලැබීම.*
● හොඳින් ඉගෙන ගැනීම.
● ගුරුවරුන්ට කීකරු වීම
● ගරු කිරීම
● නීතිගරුක වීම.
(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(03) (i) කායික හැකියා → 1, 4, 6
මානසික හැකියා → 2, 3, 5

(ii) *පුද්ගල අවශ්‍යතා*
● බීමට/ පානයට
● රෙදි සේදීම.
● ආහාර පාන පිළියෙළ කිරීම.

*සමාජ අවශ්‍යතා*
● ගමනාගමන (ප්‍රවාහන කටයුතු)
● සනීපාරක්ෂක කටයුතු සඳහා

*ආර්ථික අවශ්‍යතා*
● කර්මාන්ත
● ජල විදුලිය නිපදවීම.
(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(iii) ● ග්‍රාම නිලධාරි 04
● මහජන සෞඛ්‍ය පරීක්ෂක 05
● පොලිස් නිලධාරි 01
● කාර්මික ශිල්පියා 02
● තැපැල් ස්ථානාධිපති 03

(04) (i) මහනුවර/ කුරුණෑගල/ යාපනේ

(ii) ● ප්‍රාදේශීය ලේකම් කාර්යාලය B, C, F, G
● ප්‍රාදේශීය සභාව A , D, E, H

05. (i) *පවුල තුළ දී*
● සහෝදර සහෝදරියන් සමග සුහදව හා සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම.
● දෙමාපියන්ට කීකරු වීම.
● ආචාරශීලී වීම. (පිටුව 80)

*සමාජය තුළ දී*
● අසරණයන්ට වැඩිහිටියන්ට සහාය වීම.
● සැම ආගමකට ම ගෞරව දැක්වීම.
● එකිනෙකා කෙරෙහි ගරුත්වයෙන් කටයුතු කිරීම.
● තැනට සුදුසු ඇඳුම් පැළඳුම් තෝරාගැනීම, භාවිතය හා හැසිරීම.

(ii) ● තම අභිමානය හා ගරුත්වය ආරක්ෂා වීම.
● අන් අයගේ ගෞරවයට හා ආදරයට පාත්‍ර වීම.
● සාමකාමී සමාජයක් බිහිවීම.
● ගැටුම් අවම වීම. (81 පිටුව)

(iii) *පොත් කියවීම.*
● දැනුම ලැබීම.
● උගතෙකු විය හැකිවීම.
● යහපත් ජීවිතයකට පදනම වැටීම.

*කලණ මිතුරු ඇසුර*
● දුක සැප බෙදාගැනීම
● ආදර්ශ හා උපදෙස් ලැබීම.
● ආරක්ෂාව ලැබීම.

*මත්ද්‍රව්‍ය භාවිතය*
● මුදල් නාස්ති වීම.
● ගැටුම් ඇතිවීම.
● සමාජයෙන් අවමන් ලැබීම.
● පවුල තුළ ගැටලු ඇතිවීම.

*නුසුදුසු ආහාර පාන භාවිතය*
● ලෙඩ වීම.
● අධික තරබාරු බව
● ආර්ථික දුෂ්කරතා ඇතිවීම.
(අදාළ නිවැරැදි පිළිතුරුවලට ලකුණු දෙන්න.)

06. (i) A ● සැමගේ ගෞරවයට ලක්වීම.
● අන් අයගේ ප්‍රසාදය දිනාගැනීම.
● නායකත්වයට සුදුස්සෙකු වීම.
(පිටුව 74)

B ● සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම.

C ● සාමකාමී සමාජ පරිසරයක් ඇතිවීම.
● යහපත් පාලනයක් පවත්වා ගැනීම.
● එකිනෙකා අතර ආදරය විශ්වාසය ඇතිවීම.
(85, 86, 87 පිටු)

D ● පොදු දේපළ සුරැකීම.

(ii) A ජලය B ගොඩබිම
C වායුගෝලය D ශබ්ද දූෂණය

(iii) ● දේශීය දේ පිළිබඳ අභිමානයක් ඇතිවීම.
● දේශීය සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම.
● විදේශීය රටවලට ඇදී යන මුදල් රට තුළ ඉතිරි වීම.
● දේශීය සම්පත් ආශ්‍රිත නිපයුම් සඳහා යොමුවීම.
● දේශීය රැකියා බිහිවීම.

07.

| *හරහට* | *පහළට* |
| --- | --- |
| 5. මුද්දර | 1. බොරු |
| 6. සීරුවෙන් | 2. සීගිරිය |
| 8. විනය | 3. වෙස්මුහුණු |
| 10. පොලිතින් | 4. සරල බව |
| 11. පුස්තකාලය | 7. ගොවි සමිති |
| | 9. පොලොස් |